**7 ශ්‍රේණිය - නර්තනය**

## පාඩම : කුලු හා තාලම් නැටුම් හඳුනා ගැනීම හා නර්තන නිර්මාණය

**( නිපු. අං. 1.3 )**

### කුලු නැටුම

- මෙය **ජීවන වෘත්තීන්** හා සම්බන්ධ ගැමි නැටුමකි.
- **විනෝදාස්වාදය** අරමුණු කරගෙන නටනු ලබන ගැමි නැටුමකි.
- කෘෂිකර්මාන්තයේ දී හා මුළුතැන්ගෙයි උපකරණයක් ලෙස කුල්ල භාවිතා කෙරේ.
- කුල්ල උපයෝගී කරගෙන නිර්මාණය වී තිබෙන ගැමි නැටුමක් ලෙස කුලු නැටුම හැඳින්විය හැක.
- කමතේ දී **බැත හුලං කිරීම , කාටුව පිස දැමීම , පිරිසිදු කළ බැත ගෝනිවලට පිරවීම** ආදී කටයුතුවලදීත් , මුළුතැන්ගෙයි දී, **වී සහල් පෙළීම , සහල් පූ කිරීම** යනාදියත් කුල්ල භාවිතයෙන් කරනු ලැබේ.
- කමතේ දී ගැහැණු පිරිමි දෙපිරිස ම කුල්ල භාවිත කරනු ලබයි. නමුත් කුලු නැටුම වඩාත් උචිත වනුයේ **කාන්තා පාර්ශවයට** ය.
- විවිධ රටා දමා බටපතුරු යොදාගෙන කුල්ල නිර්මාණය කර තිබේ.
- කුලු නැටුමේ දී ගායනය සඳහා **රන් තෙලඹු වර්ණනාව සහ රත්නවල්ලියේ එන කවි** භාවිතා කෙරේ.
- කුල්ල භාවිතයෙන් විවිධ රටා මවමින් ඉතා අලංකාරව නර්තන යෙදේ.

### කුලු නැටුම් දැකිය හැකි අවස්ථා

- **පෙරහැරවල දී**
- **නිදහස් උත්සව වලදී**
- **අවුරුදු උත්සව වලදී**
- **විවිධ ප්‍රසංගවලදී**



පැවරුම

1) කුලු නැටුම වඩාත් උචිත වන්නේ කාන්තා හා පිරිමි යන පාර්ශ්වයන්ගෙන් කුමන පාර්ශ්වයටද?
..........................................................................................................................
2) කුලු නැටුමේ දී භාවිතා කරනු ලබන රංග උපකරණය කුමක්ද?
..........................................................................................................................
3) කුලු නැටුමේ දී භාවිතා කරන කවි වර්ග මොනවාද?
..........................................................................................................................
4) කුලු නැටුම් දක්නට ලැබෙන අවස්ථා මොනවාද?
..........................................................................................................................
..........................................................................................................................
5) කුල්ල සකස් කරනු ලබන්නේ කුමන අමුද්‍රව්‍යයක් උපයෝගී කරගෙනද?
..........................................................................................................................
6) කුලු නැටුමේ රූප සොයා අලවන්න.
7) ඔබ ඉගෙනගත් කුළු කවියකට අලංකාර මාත්‍රා දෙකක් නිර්මාණය කරන්න.

# තාලම් නැටුම

- ❖ **විනෝදාස්වාදය** මුල්කරගෙන නිර්මාණය වූ ගැමි නැටුමකි.
- ❖ ගායන වාදන හා නර්තන අවස්ථා වලදී තාල තැබීමට යොදා ගනු ලබන **තාලම්පට** දැතින් රැගෙන මෙය නටනු ලැබේ.
- ❖ එබැවින් මෙය තාලම් නැටුම ලෙස හැඳින්වේ.
- ❖ තාලම් කවි සරල භාෂාවකින් නිර්මාණය වී ඇත. ඇතැම් කවි **ප්‍රතිවාදීන් හා තරග කරන ස්වභාවයකින්** රචනා වී තිබේ.
- ❖ කාන්තා පිරිමි දෙපාර්ශවයම තාලම් නැටුම නටනු ලැබේ.
- ❖ තාලම්පටින් විවිධ දක්ෂතා දක්වමින් තාලම් නැටුම නර්තනයේ යෙදේ.



## තාලම් නැටුම් දැකිය හැකි අවස්ථා

- **පෙරහැර අවස්ථාවලදී**
- **විවිධ ප්‍රසංගවලදී**

පැවරුම

1) තාලම් නැටුම වඩාත් උචිත වන්නේ කාන්තා පිරිමි යන දෙපිරිසෙන් කුමන පාර්ශ්වයටද?
......................................................................................................................................
2) තාලම් නැටුමේ දී භාවිතා කරනු ලබන රංග උපකරණය කුමක්ද?
......................................................................................................................................
3) තාලම් නැටුම සඳහා භාවිතා කරනු ලබන කවි හඳුන්වන්නේ කුමන නමකින්ද?
......................................................................................................................................
4) තාලම් නැටුම් දක්නට ලැබෙන අවස්ථා මොනවාද?
......................................................................................................................................
5) තාලම් කවි වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.
......................................................................................................................................
6) තාලම් නැටුමේ රූප සොයා අලවන්න.
7) ඔබ ඉගෙන ගෙන ඇති තාලම් කවියකට අලංකාර මාත්‍රා දෙකක් නිර්මාණය කරන්න.

සැකසුම :

රවිඳු පලිහවඩන

නර්තන විෂය ආචාර්ය

හලා / වෙන් / මැල්ලව කණිෂ්ඨ විද්‍යාලය